පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| දිනය Date | 2025.05.27 පැය 1050 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/1080 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |
|---|---|---|---|---|---|---|---|

**<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාතර්ා වූ වැදගත් තොරතුරු</u>**

## 01. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කෙසෙල්වත්ත පොලිස් ස්ථානය.

2025.05.26 වන දින උදෑසන කාලයේ කෙසෙල්වත්ත පොලිස් වසමේ 19 වත්ත ප්‍රදේශයේදී කෙසෙල්වත්ත පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර හෙරොයින් ග්‍රෑම් 11 මිලිග්‍රෑම් 270 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 28 ක් වන කොළඹ 12 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.

කෙසෙල්වත්ත පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 02. හෙරොයින්, අයිස් මත්ද්‍රව්‍ය හා මත්කරල් සමඟ සැකකරුවෙකු හා සැකකාරියක් අත්අඩංගුවට - කැකිරාව පොලිස් ස්ථානය.

2025.05.26 වන දින අළුයම් කාලයේ කැකිරාව පොලිස් වසමේ මල්දෙනිපුර ප්‍රදේශයේදී කැකිරාව පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 150 ක්, අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 04 මිලිග්‍රෑම් 350 ක් හා විවිධ වගර්යේ මත් කරල් 600 ක් සමඟ සැකකරුවෙකු හා සැකකාරියක් අත්අඩංගුවට ගෙන ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 20 ක් හා සැකකාරිය වයස අවුරුදු 55 වන යකල්ල හා මල්දෙනිපුර ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.

කැකිරාව පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 03. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ග්‍රෑන්ඩ්පාස් පොලිස් ස්ථානය.

2025.05.26 වන දින රාත්‍රී කාලයේ ග්‍රෑන්ඩ්පාස් පොලිස් වසමේ ඩිමෙල්වත්ත ප්‍රදේශයේදී ග්‍රෑන්ඩ්පාස් පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 12 මිලිග්‍රෑම් 400 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

සැකකරු වයස අවුරුදු 33 ක් වන කොලොන්නාව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.

ග්‍රෑන්ඩ්පාස් පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**